බ:කො:ජ චක්‍රලේඛ අංක 06 /2016

මගේ අංක බු:ආ/10/2016
බන්ධනාගාර මූලස්ථානය
2016.01.28 වෙනි දින

බන්ධනාගාර අධිකාරි
වැලිකඩ/ බෝගම්බර/ මහර/ කො.රි.බ හා මැගසින්

<u>බුද්ධි හා ආරක්ෂක අංශයේ නිලධාරීන් යෙදවීම</u>

බුද්ධි හා ආරක්ෂක අංශය මගින් ආයතනවල සෝදිසි කටයුතු සිදු කිරිම මගින් තහනම් ද්‍රව්‍ය විශාල වශයෙන් අත්අඩංගුවට ගැනිමට කාලපරිච්ඡේදය පුරාවට කටයුතු කර ඇත. එසේම නිති විරෝධි ක්‍රියාවන් වල යෙදෙන නිලධාරින්ද නීතියේ රැහනට හසුකර ගැනිමට සමත්ව ඇත. එසේ වුවත් තවදුරටත් බන්ධනාගරවල නීතිවිරෝධි ද්‍රව්‍ය පැවතීම ආයතතනවල ආරක්ෂාවට හා සමාජ ආරක්ෂාවට තර්ජනයක් බව හඳුනාගත හැකිය. මේ පිළිබඳව ආයතන අධිකාරිවරුන්ගේ ද සහයෝගය ලබාගෙන බුද්ධි හා ආරක්ෂක අංශය විධිමත් වැඩපිළිවලක් සකස් කළ යුතුය.

ඒ අනුව බුද්ධි හා ආරක්ෂක අංශයේ සේවය වඩාත් විධිමත්ව හා ඵලදායිව අදාල ආයතන වලට ලබා දිම සඳහා මින් ඉදිරියට පහත සඳහන් උපදෙස් අනුව කටයුතු කරන ලෙස සියළුම අධිකාරිවරුන්ට දන්වමි.

1. බුද්ධි හා ආරක්ෂක අංශය මගින් බන්ධනාගාර ආයතන සඳහා යොදවනු ලබන නිලධාරින් ජෙලර් ,සැරයන් හා නියාමක නිලධාරින් කණ්ඩායම් පහකට ඇතුළත් වන පරිදි බෙදා වෙන් කර ඔබ ආයතනවලට ඉදිරියෙ දි අනුයුක්ත කරනු ඇත.

2. එක් කාණ්ඩයමක් එක් ආයතනයක මසක කාලයක් රාජකාරි කරනු ඇත.එම කාල සීමාව අවසන්වූ පසු ඒ සඳහා වෙනත් කණ්ඩයමක් යෙදවිම කරනු ලබයි. අදාල කාලය තුළ බන්ධනාගාර තුළට තහනම් ද්‍රව්‍ය ඇතුල්වීම වැලැක්වීමට එම කණ්ඩායම මෙහෙයවිම අදාල ආයතනයේ අධිකාරිවරයාගේ වගකිම වේ.

3. මෙම නිලධාරින් ආයතනවල රාජකාරි ස්ථාන වල යෙදවිමේදි කණ්ඩායම් භාර ජෙලර්වරයාට ආයතන භාර අධිකාරිවරයා සහ ප්‍රධාන ජෙලර්වරයා විසින් අවශ්‍ය උපදෙස් ලබාදිය යුතුවේ. එම

නිලධාරින් ප්‍රධාන දොරටුවේ නිළධාරින් හා සිරකරුවන් සෝදිසි කටයුතු, අමුත්තන් සෝදිසි කිරිම, වෝක්තෲ යන්ත්‍රය, පුද්ගල පරික්ෂා කිරිමේ යන්ත්‍රය හා පාර්සල් සෝදිසි කිරිමේ යන්ත්‍රය ක්‍රියාකරවිමේ කටයුතු සහ මුර අට්ටාල යන රාජකාරී ස්ථානවල පමණක් සේවයේ යෙදවිය යුතුයි. බුද්ධි හා ආරක්ෂක අංශ නිළධාරින් සේවයේ යෙදිය යුත්තේ අදාල ආයතනය පරිශ්‍රයට තහනම් හා නිති විරෝධි ද්‍රව්‍ය ඇතුල්විම වලක්වා ගැනිමටය. ආරක්ෂණ හෝ සෝදිසි කිරිමේ කටයුතු සඳහා නිළධාරින් අවශ්‍ය නම් ඒ සඳහා වන අදාල අධිකාරිගේ ඉල්ලිම අනුව බුද්ධි හා ආරක්ෂක අංශ සහකාර අධිකාරි විසින් නිලධාරි කණ්ඩායමක් ලබාදිම සිදුකරනු ඇත.

4. නිලධාරින් නිවාඩු ලබා ගැනීමේදි ඒ ඒ කණ්ඩායම් වලට යොදවා ඇති නිලධාරින් තම කණ්ඩයම තුළ සිටින නිලධාරියෙකු වැඩ ආවරණය සඳහා යෙදවිය යුතු අතර නිවාඩු ලබාගන්නා නිළධාරින් අදාල ආයතනයේ ප්‍රධාන ජේලර් මහතාට දන්වා බුද්ධි හා ආරක්ෂක ඒකකය මගින් නිවාඩු ලබාගැනිම සිදුකළ යුතුය.

5. බුද්ධි හා ආරක්ෂක අංශ නිළධාරින්ට මේවන විට බන්ධනාගාර වලට තහනම් ද්‍රව්‍ය ඇතුල්විම වලක්වාගැනිමට අවශ්‍ය උපක්‍රම පිළිඳව ප්‍රමාණවත් ලෙස පුහුණුවක් ලබා දි ඇති අතර එම නිළධාරින්ගෙන් උපරිම සේවය ලබාගැනිම අදාල ආයතනයේ අධිකාරිවරයාගේ වගකිම වේ. එබැවින් නිසි ක්‍රමවේදයන් බුද්ධි හා ආරක්ෂක අංශ නිළධාරින් සමග සාකච්ඡා කර සකස් කර බන්ධනාගාර තුළ තහනම් ද්‍රව්‍ය මැඩලිමට අධිකාරිවරු සියළු පියවර ගතයුතුය.

එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

**එච්.එම්.එන්.සී. ධනසිංහ**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ 09.**

පිටපත : බන්ධනාගාර කොමසාරිස් (බුද්ධි ආරක්ෂක)